# SOCIAL RESPONSIBILITIES & ETHICS (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# සමාජයීය වගකීම

ව්‍යාපාරය හා සම්බන්ධ සියලු ම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට උපරිම අයුරින් සාධාරණයක් ඉටු වන ආකාරයට කටයුතු කිරීම සමාජයීය වගකීම වේ.

# ව්‍යාපාරයක සමාජ වගකීම් සංකල්පය පිළිබඳ විවිධ නිර්වචන

සමස්ත සමාජයේ සහ ප්‍රදේශයේ ජනතාවගේ, සේවකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වලත් ජීවන තත්ත්වය නංවාලීමට සහ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන බවට හාසදාචාරාත්මක ව හැසිරෙන බවට ව්‍යාපාරවල අඛණ්ඩ කැපවීම ව්‍යාපාරයන්හි සමාජයීය වගකීමයි.

- World business council for sustainable development

" සමාජය තුළ ධනාත්මක බලපෑමක් ජනිත කිරීමට ව්‍යාපාර ක්‍රියාවලිය කළමනාකරණය කරන්නේ කෙසේ ද ? යන්න පිළිබඳ වූ අදහසකි, සමාජයීය වගකීම"

-Mallen Baker

ගනුදෙනුකරුවන්, සේවකයින්, සමාජය, රජය හා පරිසරය ආදී සියලු ම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට සාධාරණ ලෙස කටයුතු කරමින් කොටස් හිමියන්ට උපරිම අගයක් බිහකි ර දීම සමාජයීය වගකීම වේ.

-Narayan Murthy

ClassWork LK

# ව්‍යාපාර සමාජයීය වගකීම පිළිබඳ ව විවිධ රටවල් විසින් ඉදිරිපත් කර ඇති නිර්වචන

**ඇමරිකා එක්සත් ජනපදය (USA)**

" සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳවත්, එමගින් සමාජයට ඇති වන බලපෑම් පිළිබඳවත් පෞද්ගලික ව ම ව්‍යාපාර වගකීම සමාජයීය වගකීමයි."

**පිලිපීනය**

" ව්‍යාපාර, සමාජයට ආපසු දෙන දෑ" සමාජයීය වගකීමයි.

ව්‍යාපාර සමාජයයී වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ දැඩි අවධානයක් වර්තමානයේ වර්ධනය වී ඇත.

# ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට හා පොදුවේ සමාජයට බලපෑම් ඇති කරන බලවේග

- ව්‍යාපාර තරගය
- ගෝලීයකරණය
- විද්‍යුත් ව්‍යාපාර
- පරිසර දූෂණය

ClassWork.LK

# <u>ව්‍යාපාරවලින් සමාජයීය වගකීම් ඉටු විය යුතු ප්‍රධාන පාර්ශ්ව</u>

- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- අයිතිකරුවන්
- සමාජය

**ව්‍යාපාරය**

**ගනුදෙනුකරුවන්**

- සමානාත්මතාව
- මනා සේවක සම්බන්ධතා
- වෘත්තීමය ආරක්ෂාව
- සෞඛ්‍ය පහසුකම්

**සේවකයින්**

- සමානාත්මතාව
- මනා සේවක සම්බන්ධතා
- වෘත්තීමය ආරක්ෂාව
- සෞඛ්‍ය පහසුකම්

**අයිතිකරුවන්**

- සාධාරණ ඉපැයීමක් ලබා දීම
- ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම
- කාර්යක්ෂම ව හා අවංක ලෙස කළමනාකරණ කටයුතු මෙහෙයවීි

**සමාජය**

- රැකියා නියුක්තියට දායක වීම
- බදු ගෙවීම නො පිරිහෙලා ඉටු කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය
- ප්‍රජා සත්කාර සේවා
- හරිත නිෂ්පාදිත
- පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම

# සියලු ම පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටු වන ආකාරයට සමාජයීය වගකීම් ඉටු කරන ආකාරය

ගනුදෙනුකරුවන්ට සමාජයීය වගකීම් ඉටු කිරීමේ දී එනම් හානි අවම වන ගුණාත්මක භාණ්ඩයක් හෝ සේවාවක් සාධාරණ මිලට ලබා දීමේ දී සේවකයින් ට ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් හා අනෙකුත් පහසුකම් ලබා දීම, අයිතිකරුවන්ට ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම මෙන් ම සමාජයට පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම මගින් අනෙකුත් පාර්ශ්ව වෙත ද අවාසිදායක තත්ත්වයක් ඇති නො වී සෑම පාර්ශ්වයක ම අපේක්ෂා ඉටු කළ යුතු ය.


අයිතිකරුවන්ගේ සමාජයීය වගකීම් ආරක්ෂා කිරීමේ දී එනම් ඔවුන්ට සාධාරණ ඉපැයීමක් /ලාභයක් අත්කර දීමේ දී අනෙක් පාර්ශ්වවල එනම් ගනුදෙනුකරුවන්ට සාධාරණ මිලට භාණ්ඩ ලබා දීම, සමාජයට ප්‍රජා සත්කාර සේවා ලබා දීම ද සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා අනෙකුත් පහසුකම් සැලසීම ද මගින් ඒ ඒ පාර්ශ්වයේ සමාජයීය වගකීම් ද ආරක්ෂා විය යුතු ය.

ClassWork.LK

# සමාජයීය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට අත් වන විවිධ ප්‍රතිලාභ

- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම
- ව්‍යාපාරයේ ප්‍රතිරූපය/කීර්තිනාමය වර්ධනය වීම
- ව්‍යාපාරය පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු වීම
- ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළ හැකි වීම
- ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ කරා ළඟා වීමට පහසු වීම

ClassWork.LK


පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
BUSINESS
STUDIES
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
27
ලියාපදිංචි වීමට :-
076 36 55 550
ඉරිදා
උදෑසන 11.00
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura